

මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට
විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා
සම්බුදු රජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා!



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා**
**සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන**
**අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණමිත්‍ර**
**පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ-මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

මහමෙව්නාව භාවනා අසපුව · ශ්‍රද්ධා රූපවාහිනිය · ලක්විරු ගුවන්විදුලිය LAKVIRU RADIO

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද ගෞතම බුදු සසුන
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

## නමෝ බුද්ධාය!

ව්‍යවහාර වර්ෂ 2020ක් වූ ජූලි මස 01 දින දී ය.

පින්වත් දුවේ පුතේ,

ඔබට ලබා දෙන්නට මේ පණිවිඩය සටහන් තබන්නේ ලොව පුරා පැතිරී යන මාරාන්තික නව කොරෝනා හෙවත් කෝවිඩ් - 19 වෛරස රෝගය නිසා කැළඹිලි සහගත තත්ත්වයක් ලෝකයේ උද්ගත වී තිබිය දී යි. දහස් ගණනක් මිනිස් ජීවිත මේ වන විටත් අහිමි කරන්නටත්, ආසාදනය කරන්නටත් එම වෛරසයට හැකි වෙලා. චීනයත්, දකුණු කොරියාවත් මෙම රෝගයේ ඉක්මන් පැතිර යාම නිසා බලවත් ගැටලුවලට මුහුණ දී සිටිනවා. පර්යේෂකයන් අනතුරු අඟවන්නේ ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් මෙම රෝගයට ගොදුරු වන්නට වැඩි ඉඩක් තිබෙන බව යි.

දුවේ පුතේ, චීනය ආර්ථික අතින් බලවත් රටක්. ලෝක දේශපාලනයේ ද ඔවුන් සිටින්නේ බලවත් ස්ථානයක. එහෙත්... ලෙඩ දුක් බිය පිටුදකින්නට ඒ බලවත්කම් ප්‍රමාණවත් වූයේ නැහැ නේ ද? සැබැවින් ම ලෙඩ දුක් බිය කිසිදු බලවත්කමකින් ඉක්මවාලිය නොහැකි යි. උගත් නූගත් හෝ, දුප්පත් පොහොසත් හෝ, ස්ත්‍රී පුරුෂ හෝ, බාල මහලු හෝ කවර වෙනසක්වත් සීමා මායිම් නොකර ගනිමින් ව්‍යාධි දුක උපන් සත්වයන් ව පෙළනවා. එය යි අප කා හටත් මුහුණ පෑමට ඇති සත්‍යය. ‘ලෙඩ නොවේවා’ යන්න අප කොතරම් කැමති වුවත් ලැබිය නොහැක්කක්.

දුවේ පුතේ, මෙවැනි රෝදුක් බිය ලෝකයේ හට ගත්තේ අද පමණක් නොවෙයි. සම්බුදුරජාණන් වහන්සේ ජීවමාන ව වැඩ සිටි යුගයේ දී ම අපරිහානීය ධර්මයන් සහිත ව මැනැවින්

පාලනය වූ ලිච්ඡවී රාජධානියේ විශාලා මහනුවර දුර්භික්ෂ, රෝග සහ අමනුෂ්‍ය යන තුන්බියක් හට ගත්තා. එයින් විශාලාව කොතරම් පීඩාවට පත් වූවා ද කියන්නේ රෝගී ව මිය ගිය අයෙකුගේ මළසිරුර වළ දමන්නට හෝ කෙනෙකු ඉදිරිපත් නොවන තරමට නගරය ජනශූන්‍ය වුණා. මේ ඛේදනීය ඉරණමින් විශාලාවේ වැසියන් මුදවනු ලැබුවේ සම්බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට තෙරුවනේ ගුණ සත්‍යක්‍රියාවක් ලෙසින් වදරමින් මෙත් සිත පතුරුවා හැර ආනන්දයන් වහන්සේ මෙහෙයවනු ලැබ පිරිත් පැන් ඉසීමෙනුයි. අදටත් ඒ උතුම් රතන සූත්‍ර දේශනාව අපට අපමණ සැපය සලසමින් ජීවමාන ව වැඩ සිටිනවා. එහෙත් ඒ රටවල රතන සූත්‍රය සජ්ඣායනා කොට පිරිත් පැන් බිඳක් ඉසින්නට කවුරුන් ද සිටින්නේ...? මොන තරම් බලවත්කම් උපදවා ගත්තා වුවත්, මොන තරම් ධනවත් වුණත් සත්‍යයේ ආනුභාවයෙන් පිහිට පිළිසරණ ලබන්නට ඔවුන්ට වාසනාවක් නැහැ. එහෙත්, අපට ඒ වාසනාව තිබෙනවා.

පින්වත් දුවේ පුතේ, මේ තිසරණ ලාභය සුළුපටු දෙයක් නොවෙයි. අපේ ජීවිතවල යහපත උද කර දෙන සෑම ප්‍රතිපදාවක් ම සම්බුදුරජාණන් වහන්සේ මැනැවින් පෙන්වා දී තිබෙනවා. සත්පුරුෂ ගුණයෙන් යුතු කල්‍යාණ මිත්‍රයාණන් වහන්සේලා බොහෝ ම අනුකම්පාවෙන් යුතු ව අප ඒ ධර්ම මාර්ගයේ හික්මිය යුතු ආකාරය පහදා දෙනවා. ඔබට ඒ කලණ මිතුරන් මුණගැසිලා. ඔබට ඒ උතුම් ශ්‍රී සද්ධර්මය ඇසෙනවා. ඔබට ඒ උතුම් දහම තේරුම් ගන්නට නුවණත් තිබෙනවා. දහම් මගට උපකාරත් ලැබෙනවා. යහපත කැමති, දියුණුව කැමති, අභිවෘද්ධිය කැමති කෙනෙක් විදිහට ඔබ කළ යුත්තේ මේ ධර්ම මාර්ගය පුරුදු කිරීම ම යි.

සේවනය කිරීමට සුදුසු දේත්, නුසුදුසු දේත් සත්පුරුෂයන් වහන්සේලා පෙන්වා දෙනවා. ඒ අවවාදයන්හි හික්මෙන්න පැකිළෙන්නට එපා. ඔබට වඩා බොහෝ ඇසූ පිරූ තැන් ඇති, සමාජයේ හැසිරී ලද අත්දැකීම් ඇති ඒ සත්පුරුෂයන් යමක අවදානම, අනතුර හඳුනාගෙන ම යි එවැනි දේ බැහැර කරන්නට කියන්නේ. එසේ ම යමක පිහිට පිළිසරණ හඳුනාගෙන ම යි ඒ දේ ඇසුරු කරන්නට කියන්නේ. ඒ අවවාදය ගෞරවයෙන් පිළිගෙන ඒ අනුව කටයුතු කරන්නට ඔබ සමත් වුණහොත් ඒකාන්තයෙන් ම ඔබට එය යහපත, හිතසුව පිණිස ම යි පවතින්නේ.

**සත්පුරුෂ ගුරු උතුමන් ඇසුරේ ලබනා මේ රැකවරණය**
**ඔබ ද ගෞරවයෙන් යුතුව රැක ගනිත්වා!**

**තෙරුවන් සරණයි!**

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
පූජ්‍ය අලුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ
ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය

# පටුන


01. ධම්මික උපාසක මහතාගේ කථා වස්තුව 12

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 20

03. කට්ඨහාරී ජාතකය 26

04. සත් හට වන භව දුකට වෙදාණන් 35

05. නිර්මාණ ඉසව්ව 44


06. මහාමංගල සූත්‍රය 60

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

## (යමක වර්ගය)

**පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද**
**ස්වාමීන්ද්‍රයන් වහන්සේ**



දෙලොව ම සතුටු විය හැකි පින් රැස් කරගන්න

# ධම්මික උපාසක මහතාගේ කථා වස්තුව

## "පින් කළ විට මෙලොවත් පරලොවත් සතුටක්මයි ලැබෙන්නේ..."

පින්වතුනේ, පින්වත් දරුවනේ, බුදුරජාණන් වහන්සේ නමක් පහළ වී චතුරාර්ය සත්‍ය ධර්මය දේශනා කරන කාලය බුද්ධ කාලයයි. ඒ චතුරාර්ය සත්‍ය ධර්මය කවුරුත් කථාබස් කරනවා නම්, ඒ ධර්මය අනුගමනය කිරීමට වෙහෙස මහන්සි වෙනවා නම්, ඒ බුද්ධ කාලය ධර්මයෙන් බබලනවා. අන්න එවැනි කාලයක නුවණැති අයට සියලු වාසනාව ලබාදෙනවා. හොඳට පින් රැස් කරගන්න පුළුවන්කම ලැබෙනවා. බොහෝ දෙනෙක් පින් ගැන කතා කළත්, පින් කරන හැටි දන්නේ නැහැ. නමුත් බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙන් පින ගැන ඉගෙන ගන්න කෙනාට බොහෝ පින් රැස් කරන්න පුළුවනි. නරක තැන්වල උපත නොලබා, දෙව්ලොව උපත ලබා සැප සේ වාසය කරමින් සංසාරයෙනුත් එතෙර වෙන්න පුළුවනි. හැබැයි ඒ හැම සැපක්ම ලබන්නට පුළුවන් වෙන්නේ පින් කරන කෙනාට විතරයි.

පින්වතුනේ, පින්වත් දරුවනේ, ඔයාල අහල ඇති සැවැත් නුවර කියන නගරය ගැන. ඒ කාලෙ කොසොල් ජනපදයේ

අගනුවර සැවැත් නුවරයි. සැවැත් නුවර හත් කෝටියක ජනකායක් ජීවත් වෙලා තිබෙනවා. එයින් පන්කෝටියක්ම බුදුරජාණන් වහන්සේගේ මගඵල ලාභී ශ්‍රාවක පිරිසයි. කොයිතරම් යහපතක් ද, ඉතින් ඒ කෝටි ගණනක් සිටිය පින්වත් ශ්‍රාවක පිරිසෙන් කෙනෙක් ගැනයි දැන් ඔබට කියා දෙන්නේ.

මේ පින්වත් උපාසක මහතාගේ නම ධම්මික. එයාගෙ ජීවිතය ඒ නමටම ගැළපෙන එකක්. මෙයා ඉතාමත් ධාර්මිකයි. ඉතාමත්ම සීලවන්තයි. මේ පින්වත් උපාසක මහතාගේ බිරිඳත් ඉතාම සීලවන්ත වූ ගුණවන්ත වූ උපාසිකාවක්. මෙයාලට දරුවන් දාහතර දෙනෙක් හිටියා. සෑහෙන ලොකු පවුලක් වුනත් හැමෝම සීලවන්තයි. පුතුන් හත් දෙනෙකුත්, ගැහැණු දරුවන් හත් දෙනෙකුත් සිටියා.

මේ පවුලේ සියලු දෙනා නිතර නිතර සිල් රකිනවා. දන් පුදනවා. භාවනා කරනවා. ධර්ම සාකච්ඡා කරනවා. බුද්ධෝපස්ථාන, සංඝෝපස්ථාන කරනවා. කාටත් උදව් කරනවා. මේ උපාසක මහත්මයා දිනපතා භාවනා කරන කෙනෙක්. හොඳට සිත දියුණු කරන කෙනෙක්. මේ විදිහට පින්දහම් කරමින් සතුටින් ජීවත් වෙනවා. අන්තිමේ දී මෙයා වයසට ගිහින් මරණාසන්න වෙනවා. දැන් මෙයා ඇඳට වැටිලයි ඉන්නේ.

මේ පින්වත් උපාසක මහත්මයාට ස්වාමීන් වහන්සේලා දැකීමටත්, උතුම් බණ ඇසීමටත් මහත් ආශාවක් ඇති වුණා.

"අනේ මගේ දරුවනේ... මට මේ හුස්ම ටික යන්න කලියෙන් උතුම් නිවන් මගෙහි වඩින පින්වත් ස්වාමීන් වහන්සේලාව දැක බලාගන්න ඇත්නම් කොයිතරම් අගේද, උන්වහන්සේලාගෙන් බණ පදයක් අසන්ට ඇත්නම් කොයිතරම් අගේද" කියලා කිව්වා.

දරු පිරිස දෙව්රම් වෙහෙරට ගිහින් ස්වාමීන් වහන්සේලාට මේ කරුණ දන්වා සිටියා. ස්වාමීන් වහන්සේලා ධම්මික උපාසක මහතා දකින්නට බොහෝ සතුටු වුණා.

"පින්වත් දරුවනේ, බොහෝම හොඳයි. බොහෝම හොඳයි.... ඔය ධම්මික උපාසක මහත්මයා අපි දන්නා කාලයේ ඉඳලාම සීලවන්තයි. නිතර දන්පැන් දෙනවා. හොඳට භාවනාත් කරනවා. චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කිරීමට මේ උපාසක මහත්මයාගේ සිතේ තිබුණේ පුදුමාකාර කැමැත්තක්. බුදුරජාණන් වහන්සේ ගැනත්, ශ්‍රී සද්ධර්මය ගැනත්, ආර්යයන් වහන්සේලා ගැනත්, ඒ උපාසක මහත්තයාගේ සිතේ මහා ශ්‍රද්ධාවක් තිබුණා. ඒ නිසා එබඳු කෙනෙක් බලන්න යන එකට අපි හරි කැමතියි" කියලා ස්වාමීන් වහන්සේලා දහසය නමක් කැමැත්තෙන් ම පිටත් වුණා.

නිවසට වැඩම කරලා ධම්මික උපාසක මහත්තයා සමඟ සතුටින් කතාබස් කළා.

"පින්වත් උපාසක මහත්මයා, මොන වගේ ධර්මයක් ද අහන්න කැමති."

"අනේ පින්වත් ස්වාමීන් වහන්ස, මට මේ ධර්මය මී පැණිවලටත් වඩා රසයි. මගේ ජීවිතයේ දන් මේ අතපය වලංගු නැති වුණාට බොහෝම ප්‍රයෝජන ගත්තා. පින් ම යි රැස් කළේ. චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න හිතා ගෙනම මං හොඳට සතර සතිපට්ඨානය පුරුදු කළා. ඒ නිසා පින්වත් ස්වාමීන් වහන්ස, ඒ සතිපට්ඨාන සූත්‍ර දේශනාව අහන්න මං හරි කැමතියි. එය වදාරණ සේක්වා!"

"හොඳයි පින්වත් උපාසක මහත්මයා, බොහෝම හොඳයි. අන්තිම මොහොතේ ධර්මය පමණක් සිහිවන එක මොනතරම් ලාභයක්ද! එහෙනම් හොඳයි අහගෙන ඉන්න" කියලා ඒ

ස්වාමීන් වහන්සේලා සතිපට්ඨාන සූත්‍රය සජ්ඣායනා කරන්න පටන් ගත්තා. ඇඳේ හාන්සිවෙලා හිටිය ධම්මික උපාසක මහත්තයා දෑස් වසාගෙන, වන්දනා කරගෙන හරිම ප්‍රීතියෙන් අහගෙන සිටියා. හොඳට සිත යොමු කරගෙන සිටියා.

ටික වේලාවක් යන විට මේ උපාසක මහතා ඉදිරියේ දිව්‍යලෝකවලින් දෙවිවරුන් ඇවිදින් හිටගත්තා. එක එක දිව්‍යලෝකයට එන්න කියලා ආරාධනා කරන්න පටන් ගත්තා. උපාසක මහතාට විතරයි මෙය පෙනෙන්නේ. සතිපට්ඨාන සූත්‍ර දේශනාව අසා සිටීමට මෙය හරිම බාධාවක් වුණා. එතකොට උපාසක මහත්තයා ඒ දෙවිවරුන්ට ටිකක් ඉන්න කියලා අත ඔසවලා දනුම් දුන්නා. අර ස්වාමීන් වහන්සේලාට මෙය පෙනුණේ දැන් ඇති කියනවා වගේ. ඒ ස්වාමීන් වහන්සේලා හිතුවා,

"හා... දැන් මේ ධම්මික උපාසක මහත්මයාට සිත තැන්පත් කරන්න මෙය ප්‍රමාණවත් ඇති. ඒ නිසා තමයි ඔය නවත්වන්න කියලා කියන්නේ" කියලා හිතලා ආපසු විහාරයට වැඩියා. ධම්මික උපාසක මහතා ඒ සැණින් මරණයට පත්වෙලා තුසිත දෙව්ලොව දිව්‍ය කුමාරයෙක්ව උපත ලැබුවා.

වෙහෙරට වැඩිය ස්වාමීන් වහන්සේලා ධම්මික උපාසකතුමා සතිපට්ඨාන සූත්‍ර දේශනාව අතරමග නැවැත්තුව නිසා තමන් ආපසු විහාරයට වැඩිය බව බුදුරජාණන් වහන්සේට සැළකර සිටියා.

"පින්වත් මහණෙනි, එතැන සිදුවුණේ ඒක නොවෙයි. ධම්මික උපාසකතුමාට දිව්‍ය ලෝකවලින් දෙවිවරු ඇවිදින් ඒ ඒ දිව්‍ය ලෝකයෙහි ඉපදීම පිණිස සිත පිහිටුවන්න කියලා ඇරයුම් කරන එක කරදරයක් වුණා. ඒ දෙවිවරුන්ට කලබල නොවී පොඩ්ඩක් ඉන්න කියලයි අත උස්සලා කිව්වේ. ඔබ පැමිණ

ටික වේලාවකින් ධම්මික උපාසකතුමා මිය ගියා. දැන් එයා දිව්‍ය කුමාරයෙක්. දිව්‍ය සැප විඳිනවා. පින්කරපු කෙනාට මෙහෙම තමයි" කියලා බුදුරජාණන් වහන්සේ මේ ගාථාව වදාළා.

**ඉධ මෝදති පෙච්ච මෝදති**
**- කතපුඤ්ඤෝ උභයත්ථ මෝදති**
**සෝ මෝදති සෝ පමෝදති**
**- දිස්වා කම්ම විසුද්ධමත්තනෝ**

පින් රැස් කරනා මිනිසා - මෙලොව සතුටු වෙයි එනිසා
පරලොවදිත් සතුටු වෙමින් - දෙලොව සතුටු වෙයි එනිසා
තමා විසින් රැස් කරගත් - පින් ගැන සිහිපත් වෙන විට
සතුටු වෙවී ප්‍රමුදිත වෙයි - නිතර ප්‍රීති සිතින් යුතුව

පින්වතුනේ, පින්වත් දරුවනේ, පින් රැස් කිරීම ඕනම නුවණැති කෙනෙකුට කරන්න පුළුවනි. ඔබට ඔබ සමාදන් වෙන සිල් පද පහ රැකගන්න පුළුවන් නම්, ඒකත් පිනක්. පොඩි පිනක් නොවෙයි. ඒක ලොකු පිනක්. ඒ වගේම පොහොය දවසට උපෝසථ සිල් ආරක්ෂා කරනවා නම්, ඒ රැස් කරන පිනත් මෙපමණයි කියලා කියන්න බැරි තරම්ම විශාලයි. දිනක් බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයට වැඩම කළ වෙලාවේ උන්වහන්සේගේ ඥාතීන් වන ශාක්‍ය වංශිකයන් පිරිසක් උන්වහන්සේව බැහැ දකින්න ආවා.

"පින්වත් ශාක්‍යවරුනි, ඔබ උපෝසථ දවසට, ඒ කියන්නේ පොහොය දවසට සිල් ආරක්ෂා කරනවාද?"

"අනේ ස්වාමීනී, අපට ඒකට වෙලාවක් නැහැ නේ. මේ වැඩපළවල අවසානයක් වෙන්නේ නැහැ නේ. පොහොය දවසට වුණත් මොකක් හරි වැඩක් යෙදෙනවා. එතකොට සිල් සමාදන් වෙන්න ලැබෙන්නේ නැහැ."

"පින්වත් ශාක්‍යවරුනි..... ඒක ඔබ සියලු දෙනාටම විශාල අලාභයක්මයි. විශාල පාඩුවක්මයි. මහත්ම පාඩුවක්මයි. පින්වත් ශාක්‍යවරුනි, මෙහෙම හිතන්න. ඔන්න කෙනෙක් රස්සාවකට යනවා. දවසම මහන්සි වෙලා වැඩ කළ විට පඩිය හැටියට රන් කහවණුවක් ලැබෙනවා. එතකොට ඒක ලොකු ගණනක් නේද?"

"එහෙමයි ස්වාමීනී."

"ඉතින් තව කෙනෙක් වෙන රස්සාවක් කරනවා. එයාට දවසට කහවණු සියයක පඩියක් ලැබෙනවා. තව කෙනෙකුට තව රස්සාවක් ලැබෙනවා. එයාට කහවණු දහසක පඩියක් ලැබෙනවා. තව කෙනෙකුට ඉතාම හොඳ රස්සාවක් ලැබෙනවා. එයාගේ පඩිය දිනකට කහවණු ලක්ෂයයි. පින්වත් ශාක්‍යවරුනි, දැන් මොකද හිතන්නේ? එහෙම කෙනෙක් අවුරුදු සියයක් මුළුල්ලේ දිනපතා කහවණු ලක්ෂයක් ලැබෙන රස්සාවක් කළොත් මොන විදිහේ ධනවතෙක් වේවිද?"

අර ශාක්‍යවරු පුදුම වුණා. ඇස් ලොකු වුණා. උගුර පෑදුවා. හිනහ වෙවී පිළිතුරු දුන්නා.

"හප්පා.... ස්වාමීනී, කහවණු ලක්ෂයක් දිනකට පඩිය හැටියට ලැබෙන රස්සාවක් කරගන්න පුළුවන් නම් ආයෙ වෙන මොකවත් ඕන නැහැ. අවුරුදු සියයක් රස්සාව කළෝතින් එයා ඉතින් සිටුවරයෙක් ම යි. නිකං සිටුවරයෙක් නොවෙයි, මහා සිටුවරයෙක්."

"පින්වත් ශාක්‍යවරුනි, නෑ. ඇත්තෙන්ම එයාට ලොකු මුදලක් නෑ කියන්න පුළුවනි. යම් කෙනෙක් පොහොය දවසට හිරු නැගෙන වේලේ ඉඳලා, පසුවදා හිරු නැගෙන තුරාවට දවසක් පුරාවට අට සිල් ආරක්ෂා කළොත් එයා ලබන ධනය ඔයිට වඩා ගොඩක් වැඩියි. ඒ නිසා පින්වත් ශාක්‍යවරුනි, සිල්

රැකීම කියන්නේ සැප ලැබෙන දෙයක්මයි."

"ස්වාමීනී, එහෙනම් අපි හැකි හැම දවසෙම සිල් රකින එක අත්හරින්නේ නැහැ."

පින්වතුනේ, පින්වත් දරුවනේ, අපේ ජීවිතයේ වැඩි වශයෙන්ම කෙරෙන්නේ කාලය නාස්ති වීමමයි. තේරුමක් නැති දේවල් වෙනුවෙන් අපි පුදුම විදිහට කාලය වනසනවා. සිල් රකින්න කාලය ගන්නේ ඉතාමත්ම අඩුවෙනුයි. තාවකාලික සතුට වෙනුවෙන් නම් ඕනෑතරම් කල්මරාවි. ඒ නිසා අපට මේ ලැබෙන කාලයෙන් ප්‍රයෝජන ගැනීමට නම් සීලය නැමැති පින රැස් කරන්න ඕන. ඒ වගේම දන් දීම නැමැති පින රැස් කරන්න ඕන. ඒ වගේම භාවනාව නැමැති පින රැස් කරන්නත් ඕන. අපට නිරතුරුවම මෛත්‍රී භාවනාව කළ හැකි නම්, ඒ හැම මොහොතකම රැස්වෙන පින මෙතෙකැයි කියා ප්‍රමාණ කරන්න බැහැ. ඒ නිසා පින් රැස්කරන මිනිස් ජීවිතය අපට ලැබිල තියෙනවා. බුද්ධ ශාසනය පවතින කාලයකුත් ලැබිල තියෙනවා. උතුම් ධර්මයත් ලැබිල තියෙනවා. අපි සැප ලබාදෙන පින් හැකිතාක් රැස් කරගනිමු.



# සෙනෙහෙබර
# ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කරගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සාහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය!*

*දයාබර චමෝදි දියණිය වෙත,*

*දරුව, ඔබ ලිපි දෙකක් එවූ නමුත් මා හට ඔබට ඇමතීමට නො හැකි වීම පිළිබඳව බලවත් කණගාටු වෙමි. එයට ප්‍රධාන හේතුව මාගේ අධික කාර්යබහුල බවයි.*

*ඔබ වැනි ජීව විද්‍යා විෂය හදාරණ දියණියකට කැපකරු මාපියන් වීමට හැකිවීම ගැන මාත් ඔබගේ කැපකරු පියාත් ඉතාමත් සතුටු වෙමු. මන් ද යත් මමත් ඔබ සේ ම ඉතාමත් දුෂ්කරතා මැද ජීව විද්‍යා විෂය හදාරා වෛද්‍යවරියක් වූ නිසාවෙනි.*

*දයාබර දියණියනි, ජීව විද්‍යා විෂය හදාරණ සෑම දරුවකුගේ සිහිනය වෛද්‍ය වෘත්තිය යි. නමුත් දක්ෂතාවය තිබුණ පමණින් එය ඉටු කරගත නොහැක. තම සිත තුළ ගුණධර්ම රැසක් වගා කරන ගැනීමට ද හෙතෙම දක්ෂ විය යුතුය. එවිට ශිල්පීය දක්ෂතාවයත් සමග මුසු වූ එම ගුණධර්ම තුළින් වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම වෛද්‍යවරයා බිහි වේ. එයට ඔබ හට හැකියාව ඇතැයි මට හැඟේ.*

*මම ඔබගේ ප්‍රගති වාර්ථාව දුටුවෙමි. දරුව, එහි ලකුණුවල දුර්වලතාවයක් දකිමි. ඔබට සාමාන්‍යයෙන් වාර පරීක්ෂණවලදී සෑම විෂයකටම ලකුණු 80ක් වත් ලබාගත යුතුව තිබේ. නැතහොත් ඔබේ ඉලක්කය සපුරා ගැනීමට තරමක් අපහසු වනු ඇත. ඒ නිසා හැකි තරම් පරණ විභාග ප්‍රශ්න පත්‍ර කරන්න. දුර්වලතා*

හඳුනාගෙන ඒවාට වැඩිපුර අවධානය යොමු කරන්න. වැඩි ලකුණු පහසුවෙන් ලබාගත හැකි විෂය කරුණු නිතර නිතර මෙනෙහි කරන්න. එවිට ඔබේ ඉලක්කය සපුරාගත හැක.

දිනයේ අවදිවන විට බුදුගුණ භාවනාව, මෛත්‍රී භාවනාව සුළු මොහොතක් වඩන්න. තමාගේ අරමුණු නිතර නිතර මෙනෙහි කරන්න. එවිට ඔබගේ අනාගත බලාපොරොත්තුව සඵල කරගැනීමට ඉතා පහසු වේ.

තෙරුවන් සරණයි...!

මෙයට ඔබගේ දයාබර කැපකරු අම්මා....

# ආදරණීය අම්මේ... තාත්තේ...

මේ ඔබෙන් ලද මහගු දායාදයට කෘතගුණ එක්වූ තවත් සෙනෙහෙවන්ත සටහන්...

*නමෝ බුද්ධාය!*

*දයාබර කැපකරු මව්පියනි,*

*ඔබලා සුවසේ වෙසෙනු ඇතැයි විශ්වාස කරමි. අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් පසුව නැවත ශිෂ්‍යත්වය ලබාදීම ආරම්භ කළ පසු ඔබ වෙත එවන ප්‍රථම ලිපිය යි. මාගේ අ.පො.ස. (සා/පෙළ) විභාගය උසස් ප්‍රතිඵලයක් ලබාගෙන සාර්ථකව අවසන් කිරීමට ඔබ සහාය ලබාදුන් සේ ම ඉදිරියේ මුහුණ දෙන අ.පො.ස. (උ/පෙළ) විභාගයට ද මා හට ශක්තියක් වීමට තීරණය කිරීම පිළිබඳව ප්‍රථමයෙන් ඔබ හට කෘතඥ වෙමි. ඔබගේ එම ශිෂ්‍යාධාරය මා හට විශාල ශක්තියක් බවට මාගේ මවට විශාල සහනයක් ද වන බව සතුටින් දන්වා සිටිමි.*

*පාසලේ නිවාඩුව ආරම්භ වූ නමුත් අ.පො.ස. (උ/පෙළ) පළමු වාර විභාග යේ ඇතැම් ලකුණු ලබා නොදුන් බැවින් ප්‍රගති වාර්තාව අප වෙත නොලැබුණි. එය ලැබුණු විගස ඔබ වෙත එවීමට කටයුතු කරමි. කෙසේ වුවද රසායන විද්‍යා විෂයට ලකුණු 82ක් ද, ජීව විද්‍යා විෂයට ලකුණු 84ක් ද ලබාගෙන පන්තියේ ඉහළම ලකුණු ලබාගත් බව සතුටින් දන්වා සිටිමි. මීට පෙර දැනුම් දුන් පරිදි මා උසස් පෙළ ජීව විද්‍යා විෂයධාරාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරමි. මාගේ එකම අභිප්‍රාය වෛද්‍යවරයෙකු වී මුදල් නොමැති අසරණ ගිලනුන්ට නොමිලේ ප්‍රතිකාර කිරීමට ඒ වෙනුවෙන් ඉතාමත් වෙහෙස වී විෂය කරුණු හදාරමි. මාගේ මවද ඒ වෙනුවෙන් විශාල කැපකිරීමක් සිදු කරන අතර දිනපතා දළදා මාළිගයට ගොස් මා හට සුළුවෙන් හෝ උපකාර කරන සියලුදෙනාට පින් අනුමෝදන් කරයි. එහි දී ඔබ දෙපළ විශේෂයෙන් සිහිපත් කළ යුතුය.*

ඔබ දෙපළ මා වෙත මාස් පතා එවන මුදලින් රු.800ක් සෑම මසකම අමතර පන්තියට ගෙවන අතර ඉතිරි මුදල් ගමන් වියදම් ලෙස යොදා ගනී. නමුත් සුළු මුදලක් හෝ පිංකමක් වෙනුවෙන් වෙන් කිරීමට මම අමතක නොකළෙමි. අප පාසලේ ම සිසුවියකගේ හිසේ සැත්කමක් වෙනුවෙන් පාසල විසින් එකතු කළ ආධාරයට රු.150ක් ලබාදුන් අතර බෝධි පූජා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමට ද මුදල් වැය කළෙමි. ඔබ එවූ මුදල් මෙවැනි පින්කම් සඳහා යොදාගෙන මා ලබාගත් සියලු පින් ඔබ දෙපළට එක සේ අත් වේවා!යි ප්‍රාර්ථනා කරමි.

මා දහම් පාසල් අවසන් ශ්‍රේණි විභාගයෙන් D4 ක විශිෂ්ඨ ප්‍රතිඵලයක් ලබාගත් බව ද සතුටින් දන්වා සිටිමි. එහි සහතිකය ලැබුණු විගස එයද ඔබ වෙත එවීමට පොරොන්දු වෙමි.

මගේ මව හා සමානව මාගේ දියුණුවේ දී අවංකවම සතුටු වන ඔබ දෙපළ ද මා හට දෙමව්පියන් ය. ඉතින් අම්මේ තාත්තේ, මා ගැන පෞද්ගලිකව තොරතුරු කිසිත් නොදන්නා නමුත් මා කෙරෙහි අනුකම්පාවෙන්, ඔබගේ දහඩිය මහන්සියෙන් උපයන මුදලින් කොටසක් මා වෙනුවෙන් ද වෙන් කළ ඔබ දෙපළට උතුම් තුණුරුවනේ අනන්ත වූ ආශිර්වාදයෙන් නිදුක් නිරෝගී ජීවිතයක් ගත කිරීමට හැකි වේවා! සසර දුක් නිමා කර අමා මහ නිවනින් සැනසීමට මේ පින හේතු වේවා!

ඔබ දෙපලට තෙරුවන් සරණයි..!

මීට කෑපකරු දියණිය.

නමෝ බුද්ධාය!

මාගේ දයාබර කැපකරු අම්මේ තාත්තේ,

ඔබ දෙදෙනා විසින් ගිය මාස පුරා එවූ ශිෂ්‍යාධාර මුදල් මට ලැබුණා. මාගේ ලිපිය ප්‍රමාද වූවාට සමාවන්න. ඔබ දෙදෙනා සුවෙන් සිටිනවාද? මාගේ විභාගයේ ලකුණුත් දුන්නා. එවාට ගිය වාරයට වඩා හොඳට ලකුණුත් තිබුණා. අපේ පාසලේ වර්ෂය අවසානයේ දී ප්‍රදර්ශනයක් තිබුණා. ඒකට මම ලස්සන ගෙයක් හැදුවා. තවත් මාගේ නිර්මාණ ගොඩක් තිබුණා. ඒවාට මගේ යාළුවො, ගුරුවරු ගොඩක් ප්‍රශංසා කළා.

මම මෙවර 8 ශ්‍රේණියට සමත් වුණා. අලුත් පොත් ලැබුණා. මම ඒ පොත් ආසාවෙන් කියෙව්වා. මම ඊළග අවුරුද්දෙදි හිතාගෙන ඉන්නෙ විභාගයෙන් හොඳ ප්‍රතිඵලයක් ගන්න. ඒකට මං මේ දවස්වල හොඳට පාඩම් කරනවා. ඔබ දෙදෙනා විසින් එවූ සඟරාව මා කියවා හොඳ දැනුමක් ලබා ගත්තා.

කැපකරු අම්මේ තාත්තේ, ශ්‍රද්ධාවෙන් මා හට ලබාදුන් ශිෂ්‍යාධාර මුදල් මා වියදම් කළේ මේ ආකාරයටයි. ගණිතය පන්තියට රු. 500 ගානේ මාස හතරකදී ම ලබා දුන්නා. නොවැම්බර් මාසයේ මා හට ලබාදුන් මුදලින් රු.50ක් පන්සලේ කඨින පිංකමට පඬුරු, හඳුන් පෙට්ටියකට වියදම් කළා. ඔක්තොම්බර් මාසයේ මුදලින් රු.100ක් මාගේ අයියාට පොතක් හා පෑන් ගන්නට වියදම් කළා. ඉතිරි මුදලින් මට නිල් පෑන් දෙකයි, කළු පෑන් දෙකක් හා සිතියම් දෙකක් ගත්තා. ඉදිරි මුදල් මාගේ පාසලේ ගමන් වියදම් සඳහා යොදා ගත්තා.

මාගේ කැපකරු අම්මේ තාත්තේ, මේ සිදුකරන පින පාරමිතාවක් ම වේවායි ප්‍රාර්ථනා කරනවා. මාගේ අප්පච්චිටත් මෙය මහමෙරක් තරම් සහනයක්. මාගේ කැපකරු අම්මයි තාත්තයි මාගේ නැණස පෑදීමට මේ දරන්නා වූ වෙහෙස ම හේතු වාසනා වී මේ බියකරු සසරින් එතෙරටම යන්නට ඔබ දෙදෙනාට හැකි වේවා!

තෙරුවන් සරණයි..!

මීට කැපකරු දියණිය.

# කට්ඨහාරී ජාතකය

## දර ගෙන යන ළඳගේ කථාව

පින්වතුනේ, පින්වත් දරුවනේ,

මේ කථාවත් ගොඩාක් වටිනවා. හරි පුදුම විස්තර තියෙන්නේ. මිනිසුන් ගේ යහපත වෙනුවෙන් අපගේ භාග්‍යවතුන් වහන්සේ කටයුතු කොට වදාළ ආකාරය තේරුම් ගන්ට මේ කථාවත් උදව් වෙනවා.

සමහර විට ඔබ අහලා ඇති වාසභඛත්තියා ගැන. මේ ජාතක කථාව දේශනා කරන්ට හේතු වුනේ ඈ නිසයි.

ශාක්‍ය ජනපදයේ සුද්ධෝදන රජුගේ අභාවයෙන් පස්සේ මහානාම ශාක්‍යයා රජ බවට පත්වුණා. ඒ ශාක්‍යවරුන්ගේ මාළිගාවේ ඉතාම ලස්සන රූප ශෝභා ඇති නාගමුණ්ඩා නමින් දාසියක් සිටියා. මහානාම ශාක්‍ය රජු නිසා මේ නාගමුණ්ඩාට දියණියක් ලැබුණා. මව් පක්ෂයෙන් දාසියක් වුණාට පිය පක්ෂයෙන් රාජ කන්‍යාවක්. ඈත් ගොඩාක් ලස්සනයි. දුටු දුටුවන් ගේ නෙත් සිත් පැහැර ගන්නවා. ඈ තමයි වාසභඛත්තියා.

කොසොල් ජනපදය ශාක්‍ය ජනපදයට යාබදව පිහිටි මහා රාජ්‍යයක්. බුදුරජාණන් වහන්සේ වැඩි කලක් ගත කළේ සැවැත් නුවර නිසා ත්, උන්වහන්සේට සියලු සොළොස් මහා ජනපදවල ඇති මහා පිළිගැනීම නිසාත්, කොසොල් රජතුමාට ශාක්‍ය වංශය සමඟ නෑදෑකමක් ගොඩනගා ගන්ට ඕන වුණා. ඒ කාලේ බොහෝ රජවරු නෑදෑකම් ගොඩනගා ගත්තේ රජ කුමර කුමරියන්ගේ ආවාහ විවාහ වලින්.

ඉතින් කොසොල් රජුටත් ශාක්‍ය කුමාරියක් තමන් ගේ අන්තඃපුරයට කැඳවා ගන්න ඕන වුනා. රජදූතයෝ ගිහින් ශාක්‍ය රාජ සභාවට දැනුම් දුන්නා. එතකොට ශාක්‍යවරු ශාක්‍ය

කුමාරියක් ලෙසට වාසභඛත්තියා සරසලා පිටත් කෙරෙව්වා. කොසොල් රජු වාසභඛත්තියා ගේ රුවට වශී වුනා. කොසොල් රජු නිසා වාසභඛත්තියාට පුත් කුමරෙක් උපන්නා. ඔහු ගේ නම විඩූඩභ. මොහු කුමාරයෙකුව සිටියදී මව් පක්ෂයේ නෑදෑයන් බලන්ට ශාක්‍ය ජනපදයට ගියා. කවුරුවත් කිසි වෙනස් කමක් දැක්වූයේ නෑ. පිළිගැනීමේ උත්සවය හොඳට කළා. ඉතා හොඳින් කෑම් බීම් වලින් සංග්‍රහ කළා. විනෝද වුනා. රාජකීය සැළකිලි ලැබුණා.

කුමක්දෝ සසරේ කළ පවකට වාගේ විඩූඩභ කුමාරයා ආපසු යද්දී ඔහු ළඟම සිටි ආරක්ෂක භටයෙකුට කඩුව අමතක වුණා. කඩුව ගේන්ට රැස්වීම් ශාලාවට දුවගෙන යද්දී, වාසභඛත්තියා ගේ සම්පත් වලට ඊර්ෂ්‍යයා කළ එක්තරා දාසියක් වාසභඛත්තියාට දාසිය කියමින් බැණ බැණ විඩූඩභ කුමාරයාට දාසී පුත්‍රයා කියා බැණ බැණ කුමාරයා වාඩි වී සිටි ආසනය සෝදමින් සිටියා. නීච කෙනෙක් වාඩි වෙලා කුලවතුන් ගේ ආසනය අපවිත්‍ර වුනා කියලයි එය සේදුවේ.

ආරක්ෂක භටයා ඒ හැම දෙයක් ම හොරාට අහගෙන හිටියා. ගිහින් විඩූඩභ කුමාරයා ගේ කණේ තිබ්බා. විඩූඩභ වෛර බැඳගත්තා. ඔය වගේ කතා සඟවන්ට බැහැ. හෝ හෝ ගාලා හැම තැනම පැතිරුණා. පැතිරුනේ වාසභඛත්තියා රාජ කන්‍යාවක් නොවේ. ඈ දාසියක්. විඩූඩභ රජකුමරෙක් නොවේ. දාසී පුත්‍රයෙක් කියලා.

කොසොල් රජතුමාට කරගන්ට දෙයක් නෑ. වස ලැජ්ජාව. මූණ රතු කරගෙන ඉන්නවා. ඇමතිවරුන්ට මූණ දෙන්ටත් අමාරුයි. පුරෝහිත බමුණොත් අමුතු විදිහට බලනවා. රජතුමා වහාම ක්‍රියාත්මක වන පරිදි වාසභඛත්තියා අගබිසෝ තනතුරින් ඉවත් කළා. විඩූඩභ කුමාරයට දීලා තිබුණ

රාජකුමාර පදවියත් ඉවත් කළා. දැන් දෙන්නාම මාළිගයෙන් එළියට එන්නේ නෑ. හැංගිලා වගේ ඉන්නේ. විඩූඩභ දවසින් දවස ශාක්‍යයන්ගෙන් පළිගන්න දිනය එනතුරු ඇඟිලි ගණන් කර කර ඉන්නවා.

භාග්‍යවතුන් වහන්සේට මේ හැම දෙයක් ම පේනවා. වෙන්න තියෙන හැම දෙයක් ම දන්නවා. මේ දෙන්නා ගේ වෛරය සංසිඳුවන්න ඕනා කියල භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් භික්ෂූන් පිරිවරා උදේ වරුවක මාළිගයට වැඩියා. කොසොල් රජු වහා ඇවිත් භාග්‍යවතුන් වහන්සේව ආසනයෙහි වඩා හිඳෙව්වා.

"මහරජතුමනි.... අපේ වාසභඛත්තියා පේන්ට නැත්තේ මොකද... කොහේවත් ගිහින් ද?"

"අනේ භාග්‍යවතුන් වහන්ස.... මං මහා අමාරුවක නොවැ වැටුණේ. දෙන්නාම අයින් කළා. මං කොහොමෙයි දාසි පුත්‍රයෙකුට රජකොම දෙන්නේ? වාසභඛත්තියා කියන්නේ ශාක්‍ය මාළිගයට දර දිය ඇදපු දාසී කෙල්ලක් නොවැ."

"මහරජතුමනි... වාසභඛත්තියා නාගමුණ්ඩා ගේ දියණියක් බව මටත් දැනගන්ට ලැබුණා. නමුත් ඇගේ පියා කවුද? ඈ කා නිසා ද උපන්නේ? ඈ කාගේ කවුද.....?"

"භාග්‍යවතුන් වහන්ස, ඈ මහානාම ගේ දියණියක් නම් තමා."

"ඉතින් මහරජතුමනි, වාසභඛත්තියා නමැති මේ රාජ දියණිය මහාරජ කෙනෙකු ළඟටයි ආවේ. ඒ රජු නිසා ම යි පුතෙක් ලැබුණේ. ඒ පුතාට පියා සන්තක රජකම ලබන්ට බැරි මක් නිසාද? මෙතැන කිසි ගැටලුවක් නැහැ රජතුමනි. විඩූඩභ

කුමාරයා රජකමට සුදුසුයි. කලින් ලබා දුන් තනතුරු වලට දෙන්නාම සුදුසුයි.

"මහරජතුමනි, ඉස්සර කාලේ කැලෙන් දර කඩා ගෙනියන ළඳකට රජෙකු නිසා පුතෙක් ලැබුණා. රජතුමා ඒ පුත්‍රයාට පවා රාජ්‍යය දුන්නා."

එතකොට ඒ අතීතයේ සිදු වූ දේ අහන්න කොසොල් රජුට ආසා හිතුනා. භවයේ සැඟවී ඇති ඒ කතාව කියාදෙන්න කියල රජතුමා භාග්‍යවතුන් වහන්සේ ගෙන් ඉල්ලා සිටියා.

"මහරජතුමනි, ගොඩාක් ඉස්සර කාලෙ බරණැස බ්‍රහ්මදත්ත නමින් රජෙක් හිටියා. දවසක් මොහු වන සිරි නරඹන්න මහා යස පිරිවරින් වනයට ගියා. එදා ඒ වනයේ වනමල් නෙල නෙලා, පලතුරු සොය සොයා, ඉතාම ලස්සන සිංදු කිය කියා දර කැබලි රැස් කරමින් සිටින ළඳක් දැක්කා. ඈ ඉතා ලස්සන දිළිඳු දාසියක්. රජතුමා ඇගේ හඬටත් රුවටත් වසඟ වුණා. ඈ සමීපයට ගියා. ඒ වනයේ ම ඈ සමග සංවාසයේ යෙදුණා. එසැණින්ම ඇගේ කුසට බරක් දැනුණා. ඒ බෝධිසත්වයෝ ඇගේ කුසේ පිළිසිඳ ගත් මොහොතයි. එතකොට ඈ හඬන්න පටන් ගත්තා.

"අ.... අනේ.... දේවයන් වහන්ස.... මේ ගැත්තීට අනුකම්පා කරන සේක්වා....! මේ දැන් මගේ කුසට මහාබරක් දැනුණා. දරුවෙක් පිළිසිඳ ගත්තා කියලයි මට හිතෙන්නේ.... අනේ.... මං අසරණ වේවි."

එතකොට රජතුමා ඇඟිල්ලෙන් රාජලාංඡනය සහිත මුද්දක් ගැලෙව්වා. ඇගේ අතට දුන්නා.

"එම්බල කෙල්ලේ.... තී භය වෙන්ට එපා. මේක රාජ මුද්දක්. දුවෙක් ලැබුණොත් මේ මුද්ද විකුණලා ඇව පෝෂණය කරාපන්. පුතෙක් ලැබුණොත් මේ මුද්ද දීලා රජ මැදුරට එවාපන්" කියල පිටත් වෙලා ගියා.

ඒ දර ගෙනියන ළඳ ගේ කුසින් බෝධිසත්වයෝ උපන්නා. දරුවා දුව පැන සෙල්ලම් කරන කාලේ ආවා. 'අප්පා නැති එකා නොවැ' කියල අනිත් ළමයි විහිළු කරනවා.

එතකොට දරුවා මව් වෙත දුවගෙන යනවා.... අනේ අම්මේ..... අපේ තාත්තා කෝ.... මට ළමෝ විහිළු කරනවා. මට තාත්තෙක් නැතිලු. ඇත්තටම කවුද අම්මේ මගේ තාත්තා?"

"මයෙ රත්තරන් පුතේ.... ඔයා නිකං කෙනෙක් නොවෙයි. ඔය ළමෝ දන්නෙ නෑ. ඔයා රජපැටියෙක්...! ඔයා බරණැස මහරජ්ජුරුවන් ගේ පුතා....!"

"අම්මා එහෙම කිව්වාට කොහොමද? අම්මලා හැම ළමයිට ම ඔහොම කියනවා...... ඇත්තට ම අම්මේ.... ඒක එහෙමනම් .... අපි කොහොමද ඔප්පු කරන්නේ....?"

එතකොට ඒ අම්මා ගේ ඇතුළට ගියා. පෙට්ටියක සඟවා තිබූ කුඩා රෙදි පොට්ටනියක් අරගෙන ආවා. මොකක්දෝ දෙයක් ඔතලා ඔතලා තියෙනවා. ඒ ඔතාපුවා එකිනෙක හෙමිහිට ලෙහෙව්වා. පුතා ඇස් විදහා බලා ඉන්නවා.

"ෂා.... අම්මේ... මේ....! හරී ලස්සන මුද්දක්!"

"ඔව් පුතේ... මං මේක පණ වගේ පරිස්සම් කොරන්නේ. මේක තමයි එකම සාක්කිය. මේක පුතා පිළිසිඳ ගත්තු දවසේ රජ්ජුරුවන්නේ අතින් ම යි මට දුන්නේ.... පුතෙක් ලැබුණොත් මේ මුද්ද දීලා එවන්නත් කිව්වා."

"ඉතිං අම්මේ... ඇයි මාව තාත්තා ළඟට යවන්නෙ නැත්තේ..... අනේ අම්මේ.... මාව එක්කරගෙන යන්ටකෝ..... අනේ!"

දරුවාගෙන් බේරෙන්න බැහැ. ඈ දවසක් පුතාටත් ලස්සන ඇඳුමක් අන්දවාගෙන, මුද්දත් අරගෙන රාජ මාළිගාවට ගියා. දොරටුපාලයාට මුද්ද පෙන්නලා රජතුමාව මුණ ගැහෙන්න ඕනා කියලා කිව්වා. රාජලාංඡනය සහිත මුද්දකුත් රැගෙන ගැහැණියකුයි කොලුවෙකුයි ඇවිත් ඉන්නවා කියලා රජුට සැලකළා. රජතුමා කැඳෙව්වා. අම්මයි පුතයි ගිහින් රජුට වන්දනා කළා.

"දේවයන් වහන්ස, ඔබවහන්සේ වනාන්තරේ චාරිකා කරද්දී මං දර කඩමින් සිටිය අසරණ කෙල්ල.... එදා ඔබවහන්සේ මට මේ මුද්ද දීලා කිව්වා පුතෙක් ලැබුණොත් මේ මුද්ද දීලා මාළිගාවට එවාපන් කියලා..... දේවයන් වහන්ස.... ඔබවහන්සේ නිසා මට ලැබුණු ඒ රත්තරන් පුතා තමයි මේ...."

රජතුමාට හැම දෙයක් ම මතක් වුණා. පිරිස මැද්දේ නිසා මේ ගැන කවුරුත් දැනගන්නවාට කැමති වුණේ නෑ. ලැජ්ජාවට පත් වුණා.

"ම්.... මේ ස්ත්‍රිය ගේ.... කථාව... මට..... මතකයේ.... නම්..... නෑ.... කොහොමත් මේ කොලුවා..... මගේ පුතා වෙන්නෙ කොහොමෙයි...."

"එතකොට දේවයන් වහන්ස, මේ මුද්ද..... එදා මට ඔබවහන්සේ ගේ අතේ ඇඟිල්ලෙන් ගලවා දීපු මුද්ද.... මේ....."

රජතුමා සේවකයෙකු ලවා මුද්ද ගෙන්නාගෙන බැලුවා. ආයෙමත් බොරුවට කල්පනාවට වැටුණා වගේ හිටියා.

"මී... මෙහෙම මුද්දකුත් මට තිබුණේ නෑ නොවැ."

එතකොට ඈ හඬන්න පටන් ගත්තා. බොරු කියල රාජ උදහසට පත්වෙන්නයි දැන් යන්නේ. ඈ හඬ හඬා මෙහෙම කිව්වා.

"අහෝ...... දේවයන් වහන්ස.... දැන් මට සත්‍යක්‍රියා කරනවා හැර වෙන සාක්කියක් නම් නෑ. ඉදින් මේ මාගේ පුත් රුවන ඔබවහන්සේ නිසා උපන්නේ නම් මේ සිඟිත්තා අහසේ සිටීවා! එසේ නොවේ නම් දරුවා බිම වැටේවා!" කියලා ඈ බෝධිසත්වයන් ගේ පාවලින් අල්ලා මහත් වැරින් උඩට වීසි කළා. පුදුමෙනුත් පුදුමයි! රජතුමාව නිකම්ම නැගිට්ටුණා. ඇමැතිවරුන්වත් සිටි තැනින් නැගිට්ටුණා. සිඟිත්තා අහසින් බිම වැටුණේ නෑ. අහසේම පළඟක් බැඳගත්තා. මිහිරි ස්වරයෙන් මෙහෙම කිව්වා.


**"මහරජතුමනි මම වෙමි ඔබෙ එක ම පුතු**
**ඇති දැඩි කළ මැනව මා සෙනෙහසින් යුතු**
**අන් දරුවන් හදන ඔබ නිති ගුණෙන් යුතු**
**කිම ඔබ බැහැර කරනුයෙ පුතු තමා සතු"**

එතකොට රජතුමා ගේ හදවතෙහි දරු සෙනෙහස උතුරා ගියා. "එන්න මගේ රත්තරන් පුතේ.... මං ඔයාගේ තාත්තා.... මගේ පුතා එන්න..... මං හදාවඩා ගන්නම්" කියලා රජතුමා දෑත් උඩට එසෙව්වා. එතකොට අත් දහසක් මතු වෙලා උඩට එසෙව්වා. "එන්න පුතේ.... මගේ ළඟට එන්න" කියල හැම තැනින් ම දෝංකාර දුන්නා.

එතකොට කුමාරයා රජතුමාගේ දෑතට ආවා. රජතුමා සිඟිත්තාව ඇකයේ තබාගෙන වාඩිවුණා. දරුවාගේ අම්මාට අගමෙහෙසි තනතුර ලැබුණා.

මහරජතුමනි..... පියරජු ගේ ඇවෑමෙන් බෝධිසත්වයන් කට්ඨවාහන රජු නමින් ප්‍රසිද්ධ වුනා.... ඒ කාලේ අම්මා වෙලා හිටියේ මහාමායා බිසොවයි. පියා වෙලා හිටියේ සුද්ධෝදන රජතුමා. පුත් කුමරා වෙලා හිටියේ මම යි.”

එතකොට කොසොල් රජුට හොඳට තේරුම් ගියා. ආයෙමත් වාසභඛත්තියාට අගමෙහෙසි තනතුර ලැබුණා. විඩූඩභට රාජකුමාර තනතුර ලැබුණා.



# සත් හට වන භව දුකට වෙදාණන්...

පින්වත් දූවේ පුතේ,

ලෝකයේ දක්ෂ වෛද්‍යවරුන් සිටිනවා. ඔවුන් දක්ෂ යැයි කියන ගෞරවය ඔවුන්ට ලැබෙන්නේ රෝගය හඳුනාගන්නත්, රෝගියා හසුරුවා ගන්නත්, රෝගයට නිසි පිළියම් යොදන්නත්, රෝගියා සුවපත් කරන්නත් ඔවුන්ට හැකි නිස යි. එසේ නොවන්නවුන් දක්ෂ වෛද්‍යවරුන් යැයි පිළිගැනෙන්නේ නැහැ. සැබැවින් ම අති දක්ෂ වෛද්‍යවරයා බරපතළ ලෙඩුන් වුණත් සුවපත් කරන්නට සමර්ථකම් ඇත්තෙක්. එවැනි වෛද්‍යවරයෙකුගෙන් ප්‍රතිකාර ලබන්නට කවුරු වුණත් කැමතියි.

ලෙඩදුක්වලින් හිඟපාඩුවක් උපන් සත්වයන්ට නැහැ. උපන් සත්ත්වයා ලෙඩ වීම යන ස්වභාවය උරුම කර ගත්තෙක්. ලෙඩ හොඳ කරන්නට හැකි වුණත් ලෙඩ වීම කියන ස්වභාවය හොඳ කරන්නට කාටවත් බැහැ. අති දක්ෂ ම වෛද්‍යවරයෙකුට වුණත් හොඳ කළ හැක්කේ ලෙඩ මිසක් ලෙඩ වන ස්වභාවය නම් නොවෙයි...

නමුත්... ලෝකයේ එක ම එක වෙදදුරාණන් කෙනෙකු පහළ වුණා ලෙඩ ද ලෙඩ වන ස්වභාවය ද සහමුලින් ම හොඳ කරන, පරිපූර්ණයෙන් ම සුවපත්භාවය උපදවන... බොහොම බරපතළ ලෙඩ තිබුණු උදවිය පවා මේ වෙදදුරාණන්ගෙන් ඔසු ලබා යළි කිසිදිනෙක ලෙඩ නොවන්නවුන් බවට පත් වුණා. දූවේ පුතේ, ඒ වෙදදුරාණන් අන් කවුරුන්වත් නොවෙයි; අප ආදරයෙන් සරණ ගිය අපගේ ශාස්තෘන් වහන්සේයි. සසර දුක උපදවන සියලු කෙලෙස් ලෙඩ උන්වහන්සේ විසින් ලබා දුන් දහම් ඔසුවෙන් සුවපත් කෙරුණා. ආශ්චර්යවත්...! ඒකාන්තයෙන් ම උන්වහන්සේ සත් වගට ම භව දුකට වෙදාණෝ යි!

දුවේ පුතේ, ගුරුවරයාට අතිශය කීකරු ව මැනැවින් ශිල්ප හැදෑරූ සිසු දරුවෙක් සිටියා. නම අහිංසක. ඔහු සැබැවින් ම අහිංසක යි. ඒ අහිංසක ගතිගුණ ඇත්තාටත් සතුරු වූවන් ඔහුගේ මිතුරන් අතරේ ම සිටියා. ඔහු කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් ගුරුවරයාට නොයෙක් කේළාම් කියූ ඒ පිරිස ගුරුවරයාට සිසුවා කෙරෙහි වූ හොඳ හිත පළුදු කරන්නට සමත් වුණා.

ශිල්ප නිමා වී පිටව යන අහිංසකගෙන් ගුරුවරයා ඉල්වා සිටියේ ඒ තාක් හෝ ඉන් පසු ව හෝ කිසිදු ගුරුවරයෙකු විසින් සිසුවෙකුගෙන් නොඉල්වන ලද්දක්. දහසක් මිනිසුනගේ ඇඟිල්ල බැගින් අමුණා කරවන ලද මාලයකින් ගුරුවරයා පිදුම් කරන්නට අහිංසකට බාර කෙරුණා. ගුරුවරයා කෙරෙහි අසීමිත ආදර ගෞරව ඇති ඔහු ඒ ගුරු පූජාව කරන්නට කිසිසේත් පසුබට වූයේ නැහැ. කඩුවක් අතින් ගත් ඔහු මිනිසුන් ගමන් ගන්නා වනාන්තර පෙදෙසක රැඳී යන එන සියල්ලන් මරණයට පත් කරමින් ඇඟිලි මාලය සකසන්නට පටන් ගත්තා. මේ සා මිනිසුන් මැරූවෙකු ගැන අප ඉතිහාසයේ අසා නැහැ. අපරදිග රටවල වරින්වර මිනිසුන් තිහ හතළිහ මරා දමන තනි මිනිසුන් ගැන අසන්නට ලැබෙද්දී අප ඔවුන් හඳුන්වන්නේ මානසික රෝගීන් කියල යි. ඔව්, තරහ සිත හෙවත් ද්වේෂය කියන්නේ මානසික රෝගයක්. ඒ විදිහට සලකා බලද්දී අහිංසකත් බරපතළ රෝගියෙක් නේ ද? 'ගුරු පූජාව' පිණිස යැයි මුළාවට පත් ව, ජීවිතය අයදිමින් හඬන වැළපෙන සිය ගණන් මිනිසුන් ද්වේෂ සිත් උපදවාගෙන කිසිදු අනුකම්පාවක් නැතිව මරා දැමීමට ඔහු පෙළඹුණේ ඒ නිස යි. අහිංසක, අංගුලිමාල වුණේ ඒ ආකාරයෙන්. මිනිසුන් දහසකට වඩා ඔහු අතින් මැරුම් කෑවා. සිහි කළ පමණින් පවා ලොවේ දුක් දුරලන සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඔහුට අනුකම්පා උපදවා වැඩම කළේ ඇඟිලි නමසිය අනූ නමයකින් මාලයක්

කරගෙන ගුරු පූජාව පිණිස එක ම එක ඇඟිල්ලක් සොයමින් ඔහු සිටිය දී යි. ඒ දවසේ ම යි කොසොල් මහ රජතුමා ස්වකීය විජිතයේ අපමණ බිය සැක ඇති කරවමින් සිටි මේ චෞර ඝාතකයා අල්වන්නට චතුරංගනී සේනාව රැගෙන නික්ම යන්නට සූදානම් වූයේත්.

මහා මිනීමරුවෙකු වුවත් කුස දරා හිඳ බිහි කොට කිරි පොවා ඇති දැඩි කළ අම්මාට නම් ඒ ස්වකීය ආදරණීය පුත්‍රයා ම යි. එනිසා මන්තානි බැමිණියත් ඒ දවසේ දී ම තම මිනීමරු පුත්‍රයා වෙසෙන වනය බලා පිටත් වුණා. දහස් ගණන් මිනිසුන් මරා දමුව ද වැසී නොගිය නිර්වාණ මාර්ගය තම මව මරා දමුවහොත් අංගුලිමාල හට වැසී යනවා ම යි. නමුත්, මේ සම්බුදු සසුනේ මහා ශ්‍රාවකයෙකු වන්නට පින් තිබෙන්නෙක්. ඉතින් සම්බුදුරජාණන් වහන්සේ ඔහු සොයා ඒ වනයට වැඩම කළා.

සම්බුදුරජුන් දුටු පමණින් අංගුලිමාලගේ සිතේ අමුත්තක් හට ගත්තා. සිය ගණනින් පිරිස් එක්ව පැමිණියා වුවත් කිසිදු කැළඹීමක් නො වී ඒ සියල්ලන් නසා ඇඟිලි එකතු කොට ගන්නා අංගුලිමාල මේ හුදෙකලා ශ්‍රමණයාගේ එළඹීමෙන් පුදුමයට පත් වුණා. ඒ විපිළිසරභාවය පසෙක තබා ඔහු තමන්ට අඩු ව තිබෙන එක ම එක ඇඟිල්ල මේ ශ්‍රමණයාගෙන් සම්පූර්ණ කර ගැනීමේ අටියෙන් කඩුව ඔසවා ලුහුබඳින්නට පටන් ගත්තා.

මිනිසුන් එකිනෙකාට වෙනස්. එනිසා ම එක මිනිසෙකුට ලබා දෙන බෙහෙත තවත් මිනිසෙකුට හරි නොයන්නට පුළුවනි. එවිට වෙනත් බෙහෙතකුයි යොදා ගන්නට සිදුවන්නේ. රෝගීන්ගේ මේ වෙනස්කම් ගැනත්, වෙනස් වෙනස් බෙහෙත්

ගැනත් පරිපූර්ණ අවබෝධයක් ඇතිව වැඩ සිටි සම්බුදුරජාණන් වහන්සේ අංගුලිමාලයන් දමනය කොට සුවපත් කරලීම පිණිස ඍද්ධි ප්‍රාතිහාර්යයක් පා වදළා. උන්වහන්සේ පියවි ගමනින් වැඩම කරනවා, අංගුලිමාල කයේ ඇති උපරිම ජවයෙන් ලුහුබැන්ද වුණත් උන්වහන්සේට ළං විය නොහැකි යි...

දුවේ පුතේ, එද අංගුලිමාල කඩුව ඔසවාගෙන යොදුන් තුනක් සම්බුදුරජාණන් වහන්සේ ව ලුහුබැන්ද. ඒ කියන්නේ කිලෝමීටර් 30ක්. අප සරණ ගිය අපගේ ශාස්තෘන් වහන්සේ අංගුලිමාල කෙරෙහි අනුකම්පාවෙන් කිලෝමීටර් 30ක ඒ දුර පා ගමනින් ම වැඩම කළා. ලොවේ කවුරුන් ද අනෙකෙකු සුවපත් කරන්නට ඒ සා ඇප කැප වූ බවක් අසන්නටවත් තිබෙන්නේ...? කිසිවෙකුත් නැහැ. ඒ අපගේ ශාස්තෘන් වහන්සේ ම පමණයි...!

කිලෝමීටර් 30ක් පුරා ලුහුබැඳ ගියාට පසු ජීවිතයේ පළමුවරට අංගුලිමාලට සිතුණා 'මේ ශ්‍රමණයා අල්වන්නට මට නො හැකියි' කියා. එවිට ඔහු නැවතුණා. තවමත් පියවි ගමනින් සන්සුන් ව වඩිනා සම්බුදුරජාණන් වහන්සේට කෑ ගසා මෙහෙම කිව්වා.
"ඒයි ශ්‍රමණය, නවතින්න..."

සම්බුදුරජාණන් වහන්සේ පා ගමනින් වඩිමින් ම මෙසේ වදළා.

"අංගුලිමාල, මම නැවතිලයි සිටින්නේ. ඔබ නවතින්න."

පින්වත් දුවේ පුතේ, සම්බුදු සසුනේ උත්තම පැවිදිභාවය ලබා සියලු කෙලෙස් ලෙඩ සුව කරගෙන අමා නිවනට වැද පිරිනිවන් වැඩි අංගුලිමාල මහරහතන් වහන්සේ, සම්බුදුරජාණන් වහන්සේ වදහළ මේ එක ම එක බණ පදයෙන්

තමන්ගේ දහසක් පව් නැසී ගිය බව දේශනා කළා.

නැවතී සිටින තමන් යනවා වන්නේත්, නොනැවතී වඩිනා ඔබවහන්සේ නැවතුණා වන්නේත් කෙසේ ද කියා අංගුලිමාල එවෙලේ ඇසූ පැනයට සම්බුදුරජාණන් වහන්සේ දුන් පිළිතුර තුළිනුයි අංගුලිමාල සැබැවින් ම නැවතී සිටින අහිංසකයෙක් බවට පත් වූයේ. ප්‍රාණඝාතයේ යෙදෙමින් පාපී අකුසලයන් සිදු කරන හෙයින් අංගුලිමාල සසරේ යන බවත්, ප්‍රාණඝාතයෙන් වැළකී පාපී අකුසලයන් නසා සිටින හෙයින් සම්බුදුරජාණන් වහන්සේ සසරේ නොයා නැවතී සිටින බවත් තමයි උන්වහන්සේ ලබා දුන් පිළිතුර. පින්වත් දරුවනේ, අංගුලිමාල බොහෝ දක්ෂයි. හොඳින් නුවණ තිබුණ කෙනෙක්. වහා මේ කරුණ තේරුම් ගත්තා. සසරේ යන කෙනෙකු නොවී නවතින්නට ඔහුට බලවත් කැමැත්තක් උපන්නා. ඔහු මොහොතින් දහසක් පව් අත්හැරියා. සම්බුදුරජාණන් වහන්සේගෙන් පැවිද්ද ඉල්වා ගත්තා. අමා නිවන් සුවයෙන් සැනසෙමින් ගෞතම සම්බුදු සසුනේ මහා ශ්‍රාවකයෙක් බවට පත් වුණා. ඒ සා දරුණු වූ සිත් ඇතියවුන් පවා ලෝ සත කෙරෙහි මහා අනුකම්පා ඇති, දෙව් මිනිස් ලෝකයා විසින් පිදුම් දෙනු ලබන, පුදන්නවුන්ට අපමණ පින් එල දෙවනු ලබන මහා මුනිවරුන් වගට පත් කළේ ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේ යි... සාදු සාදු!!! ඒ අප සරණ ගිය ශාස්තෘන් වහන්සේ යි...

අලව් රජුගේ රාජධානියේ වූ විසල් නුග රුකක පිහිටි යක්ෂ විමානයක ආලවක නම් ඇති ප්‍රචණ්ඩ යක්ෂයෙකු ජීවත් වුණා. අලව් රජුගෙන් ලැබුණු පොරොන්දුවක් නිසා අලව් ජනපදයෙන් දිනපතා ඔහුගේ ආහාරයට මිනිසෙකු බැගින් බිලි කෙරුණා. ඒ දවසේ දී ඔහුට බිලි පිණිස නියමිත ව තිබුණේ අලව් රජුගේ ම පුත් කුමරා යි. ගෞතම සම්බුදු සසුනේ සතර

සංග්‍රහ වස්තුවෙන් අග්‍ර උපාසකයා බවට පත් වන පින් ඇති මේ කුමරු කෙරෙහිත්, ආලවක යක්ෂයා කෙරෙහිත් අනුකම්පා ඇතිව සම්බුදුරජාණන් වහන්සේ ආලවක යකුගේ විමානයට වැඩම කළා.

එදා හිමාලයේ මහා යක්ෂ සමාගමයේ හුන් ආලවක යක්ෂයා ස්වකීය විමනට සම්බුදුරජාණන් වහන්සේ වැඩම කර සිටින බව අසන්නට ලැබීමෙන් බොහෝ කෝපයට පත් වුණා. උන්වහන්සේ කෙරෙහි නොපහන් සිතින් එහි පැමිණි ආලවක යක්ෂයා "නික්මෙව ශ්‍රමණය" කියා සම්බුදුරජාණන් වහන්සේට විමානයෙන් බැහැර වන්නට අණ කළා. "යහපති" කියා උන්වහන්සේ විමානයෙන් බැහැර වුණා. අනපේක්ෂිත මේ මෘදු මොළොක් ප්‍රතිචාරයෙන් විමතියට පත් ආලවක යක්ෂයා "පිවිස ශ්‍රමණය" කියා යළි විමානයට පිවිසෙන්නට යැයි සම්බුදුරජුන්ට අණ කළා. "යහපති" කියූ සම්බුදුරජාණන් වහන්සේ විමානයට පිවිස වදාළා. දෙවන වරටත්, තෙවන වරටත් එය ම සිදු වුණා. මෙයින් මේ මහා ශ්‍රමණයා වෙහෙසට පත් කරලම් කියා සිතූ ආලවක යක්ෂයා හතරවන වරටත් සම්බුදුරජුන්ට විමානයෙන් පිට වෙන්නට යැයි අණ කළ ද සම්බුදුරජාණන් වහන්සේ පිට වූයේ නැහැ. එවිටයි ආලවක යක්ෂයා ස්වකීය යක්ෂ පරම්පරාවෙන් ලැබුණු ප්‍රශ්න විමසා සිටිමින් ඒවාට පිළිතුරු නොදුන්නහොත් හදවත පලා දමන බව, පරසක්වළ ගසන බව, උමතු කරවන බව පවසමින් තර්ජනය කළේ. ලොව සියලු බිය දුරු කළ සම්බුදුරජුන්ගේ ශ්‍රී රෝම ධාතුවක්වත් කම්පා කළ හැක්කෙක් ලෝකයේ නැහැ. උන්වහන්සේ අකම්පිත ව වැඩ සිටිමින් ඒ සියලු ප්‍රශ්න මැනැවින් විසඳා වදාළා. ඒ අවසන නිවන් මගෙහි ස්ථිරව පිහිටමින් ආලවක යක්ෂයා සෝවාන් මග ඵලලාභී සම්බුදු ශ්‍රාවකයෙක් බවට පත් වුණා. දිනුදු දෙව්ලොව වෙසෙමින් ඒ ආලවක දෙව්පුතුන් ගෞතම

සම්බුදු සසුනත්, සම්බුදු ශ්‍රාවකයනුත් සුරකින්නට ඇප කැප වනවා. මිනී මස් බුදිමින් චණ්ඩ ව, සැඩපරුෂ ව හැසිරුණු ඒ බිහිසුණු යක්ෂයා ව නිවී සැනසී ගිය සිතැත්තෙකු කළේ සම්බුදුරජාණන් වහන්සේ යි. ඒකාන්තයෙන් ම අසිරියක් ම යි...! අප සරණ ගියේ ඒ ශාස්තෲන් වහන්සේ ව යි.

දුවේ පුතේ, අප මේ ඉදිරිපත් කළේ කෙලෙස් ලෙඩවලින් බරපතළ ව ම රෝගී ව අමා ඔසු වළඳා සුවපත් වූ දෙදෙනෙකු ගැන පමණයි. එහෙත් මේ සම්බුදු සසුනේ එසේ සුවපත් වූවන්ගේ ප්‍රමාණය මෙතෙකැයි කියා දැක්විය නොහැකියි. අප්‍රමාණ වූ දෙව් මිනිස් ලෝකයා සම්බුදුරජාණන් වහන්සේ නම් වූ අසමසම වෙදදුරාණන් නිසාවෙන් කෙලෙස් රෝගයන්ගෙන් නැගී සිටියා. සදහට ම සුවපත් වුණා.

පින්වත් දරුවනේ, අපට මෙවැනි ශ්‍රද්ධාවක් තිබිය යුතු යි... අපට මෙවැනි පිළිගැනීමක්, දරා ගැනීමක් තිබිය යුතු යි... ඒ තමයි, "කෙලෙස් හේතුවෙන් කවර ලෙඩක් හට ගත්තා වුණත් ඒකාන්තයෙන් ම අප සරණ ගිය ශාස්තෲන් වහන්සේ ඒ ලෙඩ රෝගයන් සදහට ම සුවපත් කරන ඔසු දන්නා සේක... ඒ ඔසු දන් දෙන සේක..." කියා... රාගය නිසා, ද්වේෂය නිසා, බිය සැක උපදවාලන මෝහය නිසා අපට නොයෙක් පීඩා උපදිනවා. නොනැවතී සසර ගමනේ යෙදී සිටින අප වැන්නවුන් කෙලෙස්වලින් උපදින රෝගයන් සහිතව ම යි සිටින්නේ. රෝගියාට විශ්වාසය තිබිය යුත්තේ රෝගය ගැන නෙවෙයි; වෛද්‍යවරයා ගැන යි. එනිසා, තරහ සිතක් උපදිද්දී තරහ සිතින් කරන කියන දෙයින් ඒ ගැටලුව විසඳෙයි කියලා පාපී අකුසලය ගැන විශ්වාසය තබන්නට එපා. කිසිදු අකුසලයක් විශ්වාස කරන්නට එපා. ඒ අකුසලය නසන ඔසුව දන් දුන් මහා වෙදදුරාණන් ව පමණක් ම විශ්වාස කරන්න.

ඒකාන්තයෙන් ම උන්වහන්සේ සියලු සත්ව වර්ගයාගේ කෙලෙස් ලෙඩ ගැන දන්නවා. ඒ සියලු කෙලෙස් ලෙඩ නසන හැටිත් දන්නවා. කෙලෙස් ලෙඩ නසා පරිපූර්ණ ව සුවපත් වන්නට කැමැත්තවුන් කළ යුත්තේ කෙලෙස් ලෙඩවලින් බැට කන අතරේ ම ටික ටික හරි, කොහොම කොහොම හරි, අමාරුවෙන් හරි ඒ උතුම් ධර්ම මාර්ගය පුරුදු කරන එක යි.

පින්වන්ත දුවේ පුතේ, මේ එළඹෙන බුද්ධ වර්ෂයට ඔබත් සම්බුදුරජාණන් වහන්සේ ගැන එවැනි ශ්‍රද්ධාවකින් යුතුව පිය නගන්න. කෙලෙස්බරිත ව පීඩා විඳින ලෝකයේ නොදැවෙන, නොතැවෙන සිතක් ඇති ව සුවපහසුවෙන් ජීවත් වන්නට ඔබට නිසැකයෙන් ම ඒ ශ්‍රද්ධාව උපකාරයි!

සම්මා සම්බුද්ධ නම් වූ ඒ මහා වෙදදුරාණන්ගේ සෙවණේ සියලු කෙලෙස් රෝග නසා සුවපත් වන්නට ඔබට තෙරුවනේ ආශීර්වාදය හිමි වේවා! දෙව් රැකවරණින් ඔබට සියලු යහපත උදා වේවා! සැනසිල්ල වේවා!

තෙරුවන් සරණයි!

# නිර්මාණ ඉසව්ව


පැදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව




11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එච්.එම්. දුලක්ෂි කාවින්දයා දියණිය විසින් එවූ නිර්මාණයක්...




11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.ජ්. පසිඳු මල්ෂාන් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එම්.ජී. උත්පලා ගිම්හානි දියණිය විසින් එවූ නිර්මාණයක්...



11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එන්.ජී. කාවින්ද්‍යා චමෝදි දියණිය විසින් එවූ නිර්මාණයක්...



09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඊ.කේ. නවීෂා නිර්මාණි දියණිය විසින් එවූ නිර්මාණයක්...




07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එන්.පී. ගගුලි නයනතාරා දියණිය විසින් එවූ නිර්මාණයක්...



2019 අ.පො.ස. (උ/පෙළ) හැදෑරූ එච්.බී. ජනනි අශිංකා දියණිය විසින් එවූ නිර්මාණයක්...



06 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බී.එම්. චතුනි දිනාරා දියණිය විසින් එවූ නිර්මාණයක්...




07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩී.ඩබ්.ජී. කවීෂා ගුවනි උවින්ද්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ආර්.එම්.ජී. ෂෙහානි දිනූෂිකා දියණිය විසින් එවූ නිර්මාණයක්...



07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.එම්. කාවින්ද්‍යා සෙව්වන්දි දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එම්. විහඟි නෙත්මිණි දියණිය විසින් එවූ නිර්මාණයක්...



11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එච්.බී. නෙත්මි නවුශදී දියණිය විසින් එවූ නිර්මාණයක්...



09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ. බිම්සර මදුශාන් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...




............. වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කල්ප කවිඳු පුතණුවන්
විසින් එවූ නිර්මාණයක්...




08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ........................................
විසින් එවූ නිර්මාණයක්...



13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩී.එම්. ඉමේෂා ජයමාලි දියණිය
විසින් එවූ නිර්මාණයක්...




08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්.වී. චමෝද් දිල්ෂාන් පුතණුවන්
විසින් එවූ නිර්මාණයක්...




08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ. දිනෙත්‍ර ඕෂධ පුතණුවන්
විසින් එවූ නිර්මාණයක්...



08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන පී.ඩී.එල්. චරිත් ජීවන් පුතණුවන්
විසින් එවූ නිර්මාණයක්...

## ගුරු මෑණියනි... පියාණෙනි...

මන්දාරම් වැහි බිඳු ඇද හැලෙනා
ගංගානම් උඩුගුවනට ගලනා
මන්දා නම් නුඹ හදවත සැලුණා
දෑසින් වැගිරුණු කඳුලැලි පිස දමුවා...
නමුදු මෑණියෙ පියාණනි..,
චපල වහරින් නුඹේ ගුණ ගයනා
චපල මිනිසුන් අද ලොව සිටිනා
මනුසත් කම මහමග පාහා
ගයයි වීණා දෙසවන් පසාරා

තුන්තරා මිණිකැට මත පියවර තබනා
අටලෝ දහමට කම්පා නොවනා
සාරධර්ම ලොව පසෙකට දමනා
නුඹයි දැතෙන් ගත් එය බබලවනා

දිරිය දියණියන් ලොව දිනාවී...
නුඹ නමින් ගුණ ගී ගයාවී...
සාරධර්ම සැම අත පුරාවී...
නුඹවන් හදවත් ලොව පුබුදුවා වී...

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන A.M.A.N. සයංජලී
රත්නායක දියණිය විසින් එවූ නිර්මාණයක්....

## සරසවි සිහිනෙට වදනක්....

පොළොවේ උරුමේ කියමින්
කරනා අරගල මැද්දෙන්
දිනිය යුතුය දිවි පරතෙර
සවි පොළොවක් ගොඩ නැඟුමට

මැටි පිල්කඩ උඩට වෙලා
කුප්පි ලාම්පුවෙ එළියෙන්
බලාන ඇති අම්මා, අප්පා
නුඹ එනතුරු ලොවම දිනන්

ඒ සිහිනෙට අරුත් අරන්
විඳහලපු පියා පතින්
පියඹමු අපි නගේ, මලේ
විශ්වයෙ දුර තරණය කරන්

විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන W.A. ඉෂාරා සඳරුවනි දියණිය විසින් එවූ නිර්මාණයක්....

## ළබැඳි මිතුරු නුඹ...

මිලිනව ගිය දිවියට
යළි පණ පෙවූ නුඹ...
විටෙක කඩා වැටුණු දිවිය
යළි නගා සිට වූ නුඹ...
මිතුරිය නුඹ
මගේ දිවිය අර්ථවත් කළ
ජීවිත අරණෙහි
අව්‍යාජ ප්‍රේමයේ
සැබෑ රන් පිළිරුව නුඹ...
ජීවිත ගීයේ තනුව විය
ළබැඳි මිතුර නුඹ
අම්මා නම්විය.

08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන A.M. ගවීනා අත්තනායක දියණිය විසින් එවූ නිර්මාණයක්....

## යහපත් සමාජයක් ගොඩනගමු...

සිංහල දමිළ මුස්ලිම් මත භේදයක් නොවේවා
සියලු දෙනාම මැරෙනා බව සිහිවේවා
එහැම දෙනා එක මවකගෙ දරුවන් ලෙස සැලකේවා
ඔවුනගෙ දුසිරිත් සුසිරිත් බවටම හැරවේවා

වෛරෙන් වෛරය නොසිඳෙන බව සිතලා
අරගත් සියලු අවි ආයුධ බිම තියලා
පින් දහමට ගත සිත දෙක යොමු කරලා
පෙන්වමු අපි දම් සවි බල මතු කරලා

මත්පැන් භාවිතය පිටු දකිමු
නිති පන්සිල් හෙම රකිමු
පෝදා අටසිල් දසසිල් රකිමු
යහපත් දරු පරපුරක් ගොඩ නගමු

අංගුලිමාල මහසෑ වැනි සෑයන් ඉදිවේවා
ඒ හැම සෑයකටම උවටැන් කෙරුමට මට හැකිවේවා
තව තව කුසල් රැස්වී පින බලවත් වේවා
මෙපින් බලයෙන් මෙසසර දුක්ගිනි කෙළවර වේවා

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන පද්මිණී චාරුකා
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## ගෙදර බුදුන් අම්මා.......

ගිලෙන්නට හිරු අවරගිර අහසේ බැබළෙමින් තිබුණෙ ද
හෙට ලෝකයට  මං පෙත්  විවර කරන්නට
දරුවන් තනන දයාබර අම්මේ
දරා දස මාසේ මා ඔබ කුස තුළ
කෙළි දෙළින් වැඩුණු කාලය
ඔබ කොයි තරම් දුක් විඳින්නට ඇත් ද
රතු ලේ රස සුදු කිරි බවට පත් කර
මා කයින් මෙන් ම සිතින් ද පෝෂණය කරන්නට
ඔබ ගතින් මෙන් ම
කයින් ද වූ වෙහෙස නිම කළ නොහැක
කර දඬු උස්මහත් කෙලෙහි
මට මා ලොකු දරුවෙකු සේ සිතුණ ද
මාගේ මෑණියන්ට මා
කුඩා අත දරුවෙකි
වැරදි වලට තැලුව ද
එය ඔබ කරන්නේ හිතට
සමගියෙන් නම් නොවෙයි
මා පාසල් ගිය පසු
දෙරකඩට වී ඉඳින්නේ
මා එනතුරු නොවේද
එය මට ශක්තියකි
මගෙ අම්මේ,

10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන H.L. මෙත්මි පුන්සඳලි
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## වඳිම් පා යුග...

ඉගෙනුම ලබන්නට මා හට පිහිට වන
මාගේ දිළිඳු මව්පියනට දිරිය වන
ඔබ වන් උතුම් පා යුග මා වැතිර බිම
නිතැතින් වඳිමි පා යුග මා වැතිර බිම

මා දයාබර වූ කැපකරු මව්පියනේ
මහමෙර ලෙසට දැනෙනවා ඔබෙ උපකාරේ
කෙදිනක හෝ එනවා උගතෙකුවී අනාගතේ
ඔබේ පා යුග වඳින්නට මා ඉක්බිතියේ

09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන චේතමී වාසනා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## නිර්මාණය....

නැගෙන ලෙස
සයුරු රළ......
නොනැවතී රෑ...දිවා
සිතිවිලිත් ඒ වගෙයි
නිමක් නැත හඹා එයි
පසිඳුරන් දඟ නිසා
රැක්ම දුෂ්කර තමා
දෙනෙත් හැර බැලුවොතින්
කමටහන් නොවැ සැමා...!
සිත පුහුණු කළ යුතුයි
අවැසි තැන දා උපා
තව තවත් වී පමා
දැලක පැටෙලෙනු එපා
ගත්ත දින සිත නිවා
සිල්සුවඳ එයි හමා
කරගෙනම පව් කමා
සුවය විඳගමු අමා.....!

11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන K.M. සචිනි ප්‍රබෝධ්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## පමා වන්නේ කිම..?

නොදනී කිසිත් කිසිවෙක්ම
ගෞතම බුදු රජුන් හැර
මේ මහා සංසාර ගමනේ,
වූයේ ආරම්භය කෙසේ
නමුත් දනී අප සැවොම,...
මතු භවය උදෙසා
රැස් කරගත යුතු බවට
පින්කර්මයෝ නිතර
නොවේ ඉන් එහා පිහිටක්
සසර පුරා අප කිසිවෙකුට,
ඉතින්......
පමා වන්නේ කිම..?
බලා සිටින්නේ කිම..?
සිතන්නේ කිම..?
නොවේ වෙන් කරගෙන පැමිණි,
කාලයක් උපතින්ම අප
පින් රැස් කරගන්නට
ගත වන්නේ කිනම් නිමේෂයක් ද
සිත, කය, වචන නම් තිදොර සමඟ
වීර්යය වැඩිය යුත්තේ
නෙළා ගන්නට නොවෙද
දෝත පුරා නිර්වාණ පුෂ්පය,
එයයි අප සැමටම වන
අති උතුම් පරම සුන්දර සතුට
එයයි අප සැමටම වන එකම ජීවනාභියෝගය......

10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන A.P. නෙත්මි කවිශ්‍යා
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## විභාගය…

බමන රැගුමින්
එකම යුද්ධයකට
කටු පොරකයි
අංක මුහුණතක

කඩදහි කොළ
පිරෙන්ට
මනා හරඹයක්

ඇඟිලි අතරට
හිරකරගෙන
තීන්ත කූරක්

කලතම් සීරුවට
හිරිවැටුණු මොළයක්

අවසන
පැය තුනක්
හෙලම්
දිග සුසුමක්.

## සිහිනය…

දහ දොලොස් පලකට
පැලී ඉරිතැළුණු
මනා විල් පොකුණු
සනසවන්ට
දියදෝතක් රැගෙන
ආවෙමි මහා සාගරයෙන්
නොවල
ලෝ දිය පැසෙන
සහරාවක ගල්පතුරු
දෙබෑකර

## සයුරු නිම්…

සමනල සිරසින්
උපන් සිහිලසෙන්
නිවා දස් ගිනි
සනසා මිහිමව්
එක ම මුවදොරින්
වඩනා තුරු නුඹ
බලා හිඳිමි
දෙනුවන් අයා මම…

## සොබාදම්…

හරිත මුදුනත
පතිත ගිනියම් හිරු
උරා පෙරහන්කඩින්
අතුරා ගුරු පාටට
තඹපාට ඇතිරිලි
මැවූ සිතුවම්
විඳිමි විනි විඳිමි…

11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුබෝධා මදුමාලි දියණිය විසින් එවූ නිර්මාණයක්….

## කැපකරු මාපියාණනි...

නැණින් හොබවන
ගුණෙන් පුබුදන
දිරිය වඩවන
නුඹයි කැපකරු මාපියන්

වැර යොදා විරි දරා
උපයනා සතයකුදු පවා
තුටු සිතින් පුද කරා
මගේ දිවි එළි කරා

ශිල්පාභරණය ගෙලෙහි
පළඳවන්නට
විදු මාතාවන් වෙත
පියනගන
පුංචි මල් කැකුළුවන් හට
නිබඳ රැකුලක් වන්නට
වෙහෙසෙනා

කැපකරු මාපියාණෙනි
ඔබේ ඒ පින් මහිම
නිවන් පිණිසම හේතුවේවා!

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ..............................
.... දියණිය විසින් එවූ නිර්මාණයක්....

## පිළිසරණ...

ඉමක් කොනක් නැති සසරේ
හවුහරණක් සොයන මනු සිත
පිළිසරණක් නැතිව අසරණ වී
හඬා වැළපෙන දා
මංමුලා වූ සිතිවිලි රැගෙන
කා ළඟට යන්න ද?
කා සරණ යන්නද?
එසේ ගිය ද ඵලයක් නැති
මුලාව හා භීතිය
රජයන ලොව තුළ
පිහිටට ඉන්නේ
තෙරුවන පමණයි
බුදු දම් සඟ යන
තෙරුවන පිළිසරණ කොට
තෙරුවන් සරණ යන්නේ නම්,
සසර බියෙන් පෙළෙන සිතට
උතුම් පිළිසරණ එයයි.

11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන J.G. චමෝදයා උදයාංජලී මුතුමාලි දියණිය විසින් එවූ නිර්මාණයක්....

ජීවන මං තලාවේ
වෙහසකර ගමනෙහි
නිබඳවම රැඳීසිටිමින්
සිසිල් පැන් පොදක් වී
දෙපයින් නැගී සිටින්නට
නිරන්තර සවිය වනුයේ නුඹයි....

අධ්‍යාපනය නම් සඳුට
සිප්කිරෙන් පණ පොවා
නිශාන්තය පුරාවට
ඒකාලෝක කිරීමට
නිරන්තර එළිය වනුයේ නුඹයි....

අමාවක ගුවන් ගැබ එළිය කරමින්
පායන පුරහඳ මෙන්
මා දිවියේ ආලෝකය වන
දයබර කැපකරු මව්නි,
පියාණෙනි....

**සදා මා ඔබට ණයගැතියි**
**ඔබට මාගේ උපහාරය වේවා!!!**

2021 අ.පො.ස. (උ/පෙළ) හාදාරණ L. දෙව්මිණී ලක්රන්දිකා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## බුදු හිමි පාමුල සිට...

මලක් වන්නට
නොහැක හිමියනි,
මිනිස් බව ලැබූ
මෙමා හට අද....

මලක් වූ දා
මගේ ජීවය,
ඔබේ පා මුල
පර වුණාවේ....

සමිඳු දෙස බුදු
බණ අසා මගෙ,
නිවුණු සිත එක්
තැන් වුණා වේ....

හිමි දෙපා ළඟ
නිවී සැනහෙන
දිනක් මට තව
ළං වුණා වේ....

විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන W.A. ඉෂාරා සඳරුවනි දියණිය විසින් එවූ නිර්මාණයක්....

## අරුත් තේරුම් ගනිමින් මිහිරට සජ්ඣායනා කරන්න

# මහාමංගල සූත්‍රය

**ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. අථ බෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කේවලකප්පං ජේතවනං ඕභාසෙත්වා යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි ඒකමන්තං ඨිතා බෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.**

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුතුමා ගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හී එක්තරා දෙවියෙක් මධ්‍යම රාත්‍රියෙහි මනස්කාන්ත පැහැයකින් යුතුව මුළු දෙව්රම බබුළුවා ගෙන භාග්‍යවතුන් වහන්සේ ළඟට පැමිණියේ ය. එසේ පැමිණ භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත්පස්ව සිට ගත්තේ ය. එකත්පස්ව සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ පැවසුවේ ය.

**බහූදේවා මනුස්සා ච - මංගලානි අචින්තයුං**<br>**ආකංඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගලමුත්තමං**

බොහෝ දෙවි මිනිස්සු ද - සිතුවෝ ය මංගල කරුණු ගැන<br>යහපත කැමති ඔවුනට - උතුම් මංගල කරුණු ගැන<br>පහදා දෙන්න මුනිඳුනි

**අසේවනා ච බාලානං - පණ්ඩිතානඤ්ච සේවනා**
**පූජා ච පූජනීයානං - ඒතං මංගලමුත්තමං**

නරක අය නොම ඇසුර ද - කළණමිතුරන් සමග නිති ඇසුර ද
පිදිය යුත්තන් පිදුම ද - මේවා උතුම් මගුල් කරුණු ය

**පතිරූපදේසවාසෝ ච - පුබ්බේ ච කතපුඤ්ඤතා**
**අත්ථසම්මාපණිධි ච - ඒතං මංගලමුත්තමං**

නරක අය නොම ඇසුර ද - කළණමිතුරන් සමග නිති ඇසුර ද
පිදිය යුත්තන් පිදුම ද - මේවා උතුම් මගුල් කරුණු ය

**බාහුසච්චඤ්ච සිප්පඤ්ච - විනයෝ ච සුසික්ඛිතෝ**
**සුභාසිතා ච යා වාචා - ඒතං මංගලමුත්තමං**

බොහෝ දැන උගත් බව - නොයෙකුත් ශිල්ප දත් බව
විනයකින් යුතු බව - මනා කොට හික්මුන බව
සුභාසිත වූ යම් බසක් වෙද - මේවා උතුම් මගුල් කරුණු ය.

**මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංගහෝ**
**අනාකුලා ච කම්මන්තා - ඒතං මංගලමුත්තමං**

මව්පිය උපස්ථානය - අඹුදරුවන්ට සැළකුම
මැනැවින් වැඩ කෙරුම - මේවා උතුම් මගුල් කරුණු ය.

**දානඤ්ච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සංගහෝ**
**අනවජ්ජානි කම්මානි - ඒතං මංගලමුත්තමං**

මව්පිය උපස්ථානය - අඹුදරුවන්ට සැළකුම
මැනැවින් වැඩ කෙරුම - මේවා උතුම් මගුල් කරුණු ය.

**ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ**
**අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගලමුත්තමං**

පවෙහි නො ඇලීම ද - හැම පවින් වැළකීම ද
මත් පැනින් දුරු වීම ද - දහම තුළ නො පමාව ද
මේවා උතුම් මගුල් කරුණු ය.

**ගාරවෝ ච නිවාතෝ ච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා**
**කාලේන ධම්මසවණං - ඒතං මංගලමුත්තමං**

උතුමන්ට ගරු කිරීම ද - නිහතමානී වීම ද
ලද දෙයින් තුටු වීම ද - කෙළෙහි ගුණ සැලකීම ද
නිසි කලට බණ ඇසීම ද - මේවා උතුම් මගුල් කරුණු ය

**ඛන්තී ච සෝවචස්සතා - සමණානඤ්ච දස්සනං**
**කාලේන ධම්මසාකච්ඡා - ඒතං මංගලමුත්තමං**

ඉවසන ගුණෙන් යුතු බව - යහපතට අවනත බව
ශ්‍රමණවරු බැහැ දැකුම ද - නිසි කල දම් සභාව ද
මේවා උතුම් මගුල් කරුණු ය

**තපෝ ච බ්‍රහ්මචරියඤ්ච - අරියසච්චානදස්සනං**
**නිබ්බාණසච්ඡිකිරියා ච - ඒතං මංගලමුත්තමං**

තපසෙහි විසීම ද - බඹසරෙහි හැසිරීම ද
ආර්ය සත්‍යයන් දැකීම ද - නිවන අවබෝධ වීම ද
මේවා උතුම් මගුල් කරුණු ය

**ඵුට්ඨස්ස ලෝකධම්මේහි - චිත්තං යස්ස න කම්පති**
**අසෝකං විරජං ඛේමං - ඒතං මංගල මුත්තමං**

අටලෝ දහම එන විට - නො සැලේද යමෙකුගෙ සිත
සෝක නැති කෙලෙසුන් නැති - බියක් නැති තැන සිටි විට
මේවා උතුම් මගුල් කරුණු ය

**ඒතාදිසානි කත්වාන - සබ්බත්ථමපරාජිතා**
**සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං - තේසං මංගලමුත්තමන්ති**

මේ අයුරින් කටයුතු කොට - අපරාජිත වී හැම තැන
යහපතට ම යති හැම තැන - එය ඔවුන් හට
උත්තම මගුල් කරුණු ය

**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**
මේ සත්‍යානුභාවයෙන් සැමට සෙත් වේවා!